# විසෙන් විස නැසිය හැක්කා සේ කාමයෙන් කාමය නැසිය හැකි ද?

(වජ්‍රයානය ඇසුරින් විමසුමක්)

ඒ. ජී. අයි. එස්. විජේවර්ධන[1] ඩබ්ලිව්. ජේ. පී. විජේසිංහ[2]

**හැඳින්වීම**

සම්භාව්‍ය බෞද්ධ ආගමික ඉතිහාසයෙහි නවතම සම්ප්‍රදාය බවට පත්වන වජ්‍රයානය වජ්‍රයක් හා සමාන වූ ප්‍රඥාව හා අද්වයතාවෙන් හෙවත් ඒකත්ව ලක්ෂණයෙන් යුත් ශූන්‍යතාව සඞ්කේතවත් කරන වජ්‍ර අනුසාරයෙන් එනමින් හඳුන්වා ඇත. උක්ත වජ්‍රයාන සම්ප්‍රදායේ පුද පූජාමය පිළිවෙත් සතරක් දක්වනු ලැබේ. සරණාගමනය, පාපදේශනාව, ආචරියයෝග, මණ්ඩලපූජා යනු එම සතරාකාරය යි. උක්ත සිව්වැදෑරුම් ආගමික ප්‍රතිපදාවේ තුන්වැන්න වූ යෝග අවස්ථාවේ යෝගියා තමා ඉෂ්ට දේවතාවා ලෙසත් තම සහායිකාව ඉෂ්ට දේවතාවිය ලෙසත් සිතින් මවාගෙන දෙදෙනාගේ ලිඞ්ගික ව එක්වීමේ රූපකය තුළින් සියලු ද්විභේදන ඉක්මවා ලබන්නා වූ අති උත්කෘෂ්ට ඒකත්වය පිළිබඳ ව සිතින් මවා ගැනීමේ ක්‍රියාවලිය මූලික ග්‍රන්ථවල පැහැදිලිව දක්වා ඇත. ශාරීරික ශක්තිය ප්‍රඥාවක් බවට පරිවර්තනය කොට එමගින් කාමය කෙරෙහි ඍජුව මුහුණ දී එය විනාශ කොට දැමීම, එහි අරමුණ බව ඔවුන්ගේ මතය යි. ඒ අනුව ඔවුන්ගේ අදහස වන්නේ විසෙන් විස මෙන් කාමයෙන් කාමය නැසිය හැකි බව යි. උක්ත කාරණය සමාජගත වීම ප්‍රායෝගික වශයෙන් කෙතරම් දුරට සමාජ සභ්‍යත්වයට බලපෑමක් කරන්නේ ද යන්න මෙම පර්යේෂණයෙන් විමර්ශනය කෙරේ.

**පර්යේෂණ අරමුණ**

වජ්‍රයානිකයන්ට අනුව කාමය දුරු කිරීම සඳහා කාමය උපයෝගී කර ගැනීම භාවිත ක්‍රමවේදයකි. එහෙත් කාමය පිළිබඳ ආදි බෞද්ධ විසඳුම විරාගික ය. රාගය හා විරාගය අතර පවතින උක්ත ක්‍රමවේදයන් පුද්ගලයා කෙරෙහි ඇති කළ බලපෑම පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කෙරේ. පර්යේෂණ මාතෘකාව උදෙසා ප්‍රාමාණික තත්ත්වයෙහි ලා සැලකෙන ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය මෙහි ලා ප්‍රමුඛ ව භාවිත කෙරුණි.

**පර්යේෂණ සාකච්ඡාව**

වර්තමාන ලෝකය තුළ පවත්නා ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදාය තුන අතරින් තුන්වැන්නෙහි ලා සැලකෙන වජ්‍රයාන සම්ප්‍රදාය සම්භාව්‍ය බෞද්ධ ආගමික ඉතිහාසයෙහි නවතම සම්ප්‍රදාය බව විද්වත් මතය වේ. තන්ත්‍රයානය, මන්ත්‍රයානය හා වජ්‍රයානය ලෙස වජ්‍රයානය හැඳින්වීම සඳහා භාවිත නම් තුනක් වන අතර, වජ්‍රයාන සම්ප්‍රදාය රහස්‍යභාවය මූලික ලක්ෂණයක් කොටගත් ඉගැන්වීමක් ලෙස ද ප්‍රකට ය. 1950-60

[1]. බෞද්ධ අධ්‍යයනය (ශාස්ත්‍රවේදී උපාධි - තෙවන වසර), නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, මානෙල්වත්ත, කැලණිය, ශ්‍රී ලංකාව.

[2]. බෞද්ධ අධ්‍යයනය (ශාස්ත්‍රවේදී උපාධි - තෙවන වසර), නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, මානෙල්වත්ත, කැලණිය, ශ්‍රී ලංකාව. *prathibharanasingha@gmail.com*

දශකයෙහි මහජන චීනය විසින් ටිබෙටය යටත් කර ගැනීමත් සමග වජ්‍රයානය රැගත් ටිබෙට් බෞද්ධයන් ලොව පුරා ව්‍යාප්ත වීම ආරම්භ විය. මෙම සම්ප්‍රදායේ ආරම්භය පිළිබඳ නිශ්චිත ඒකත්‍වයක් නොමැති අතර, මෙම සම්ප්‍රදාය ක්‍රි.ව. 06 වන සියවසේ දී ඉන්දියාවෙහි ආරම්භ වූ බව බහු විද්වත් මතය වේ. මෙම සම්ප්‍රදායෙහි ඇතැම් මූලික ලක්‍ෂණ භාරතීය ආගමික සම්ප්‍රදායන්හිත් හීනයාන හා මහායාන සම්ප්‍රදායන් තුළත් ඇති බවට ඇතැම් කාරණා අභිමුඛව පැහැදිලි වේ. වජ්‍රයාන ආගමික ප්‍රතිපදාවේ සිව්වැදෑරුම් ආගමික ප්‍රතිපදාව ප්‍රකටව පවතින අතර, සරණාගමනය, පාපදේශනාව, ආචරියයෝග හා මණ්ඩලපූජා යන එම අවස්ථාවන්හි තෙවැන්න යෝග අවස්ථාව යි. යෝග යනු භාවනා යෝගී වීම යි. ක්‍රියා හා චර්යා යන ක්‍රියාන්විත පසු කරන අනුගාමිකයා විසින් මනස දියුණු කිරීමවස් භාවනානුයෝගී වීම තුළින් වඩාත් උසස් ආධ්‍යාත්මික තලයකට පැමිණීම මෙම ප්‍රතිපදාවේ පරමාර්ථය යි. අනුත්තර යෝග, මහායෝග අනුයෝග, අතියෝග යනුවෙන් අවස්ථා තුනක් දක්වන මෙම යෝග අවස්ථාව අවසාන ඵලය ලබා ගැනීම සඳහා වූ සමගාමී මාර්ග තුනක් ලෙස ඉදිරිපත් කරයි. න්යිංමාපා නිකායිකයන් මෙම ප්‍රතිපදාව ලිඞ්ගික රූපය මඟින් විස්තර කොට ඇති අතර, යෝගියා තමා ඉෂ්ට දේවතාවා ලෙසත් තම සහායිකාව ඉෂ්ට දේවතාවිය ලෙසත් සිතින් මවාගෙන දෙදෙනාගේ ලිඞ්ගිකව එක්වීමේ රූපකය තුළින් සියලු ද්විභේදනයන් ඉක්මවා ලබන්නා වූ අති උත්කෘෂ්ට ඒකත්‍වය පිළිබඳ ව ග්‍රන්ථානුසාරයෙන් දක්වා ඇත.

මෙහි දී මතුවන ගැටලුව වන්නේ උක්ත ප්‍රතිපදාව මෙම සම්ප්‍රදායෙහි පැවිද්දන් අතර පැවතුණි නම් ඉන් පැවිදි විනයටත් ගිහි පිරිස් අතර පැවතුණි නම් එසේ එක්වන දෙදෙන අඹුසැමියන් නො වන නිසා සමාජ සදාචාරයටත් හානි සිදුවීම ය. සමාජ සදාචාරය පිළිබඳ ගැටලුව පසෙක ලා බෞද්ධ ප්‍රතිපදාවට අනුව බලන විට කාමය තුළින් කාමය නැසීමේ මාර්ගය වඩාත් ප්‍රබල ගැටලුවකි. විසෙන් විස නසන්නාක් මෙන් කාමයෙන් කාමය නැසිය හැකි බව වජ්‍රයානිකයන්ගේ අදහස යි. විසෙන් විස නැසීමේ හෝ ගින්නෙන් ගින්න නැසිමේ රූපකය තරමක් ප්‍රායෝගික තලයෙහි ලා අදාළ බවක් පෙනුන ද කාමයෙන් කාමය නැසීම කෙතරම් දුරට ගැළපේ දැයි කිව නො හැකි ය. මිනිස් මනස පිළිබඳ ආදි බෞද්ධ විග්‍රහය නිවැරදි නම් එය එසේ වීමේ සම්භාවිතාව අඩු ය. බොහෝ විට සිදු විය හැක්කේ අධික කාමරතිය නිසාවෙන් මානසික මෙන් ම කායික පීඩාවට පත්වීම ය. පුද්ගලයා ඉන්ද්‍රිය සංවරයෙන් (**ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො**) නො යුතු කල මෙම පීඩාවන් වර්ධනය වී අවබෝධයෙන් ඈත් වේ. මෙම ගැටලුවට බෞද්ධ විසඳුම නම් කාමය අවබෝධයෙන් දුරු කළ යුතු බවය. එකී මාර්ගය ඇත්තේ රාගය තුළ නො ව විරාගය තුළ ය.

**පර්යේෂණ සමාලෝචනය**

ඇතැම් සමාජ කතිකාවත් තුළ බෞද්ධ අර්ථකථනයන්හි දක්නට ලැබෙන ප්‍රමුඛ මාතෘකාවක් වන කාමය සැබැවින් ම අර්බුදකාරී මාතෘකාවකි. වජ්‍රයාන සම්ප්‍රදාය තුළ ආගමික ප්‍රතිපදාවක් ලෙස කරලියට පැමිණ ඇති කාමයේ නිරෝධය පිළිබඳ විග්‍රහය පුද්ගලානුබද්ධ ව සමාජයට යම් ප්‍රායෝගික බලපෑමක් එල්ල කර ඇති බව ඇතැම් බෞද්ධ අර්ථකථන අවස්ථාවන්හි දක්නට ලැබෙන්නකි. විරාග රාගය තුළ මතු කෙරෙන උක්ත කාරණාවෙහි ප්‍රතිඵලය රාගික හෝ විරාගික පුද්ගලයා ප්‍රායෝගික තලයෙන් ජනගත කිරීම ය. අවබෝධයෙන් තොර ක්‍රියාව ධර්මමාර්ගය තුළ කෙතරම් සුදුසු වන්නේ දැයි මෙමඟින් සලකා බැලේ.

**ප්‍රමුඛ පද:** වජ්‍රයානය, රාගය, විරාගය, මුල් බුදුසමය, සදාචාරය, විමුක්තිය

**මූලාශ්‍රය**


- ගුණතිලක, ඩබ්ලිව්.ඇම්. (2013). **බෞද්ධ ගුඪවාදය පිළිබඳ හැඳින්වීමක්.** නුගේගොඩ: සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන.
- ධම්මදස්සි හිමි, නායිම්බල (2009). **ටිබෙට් බුදුසමය.** පොල්ගස්ඕවිට: කර්තෘ ප්‍රකාශනය.
- නානායක්කාර, සනත් (2003). **මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (2007). **සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ,
- ප්‍රඥාකීර්ති හිමි, කොටහේනේ (2000). **ආගම හා සමාජය.** කැලණිය: විද්‍යාලඞ්කාර පිරිවෙන.
- මහින්ද සඞ්ඝරක්ඛිත ස්ථවිර, කොල්ලුපිටියේ (2009). **බෞද්ධ මහාදාර්ශනිකයෝ 02** (විඥානවාදය). කොළඹ: සීමාසහිත ගොඩගේ ජාත්‍යන්තර ප්‍රකාශකයෝ.
- තිලකරත්න, අසංග (සංස්.). (2008). **මූලමාධ්‍යමකකාරිකාව.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- වයමන්, එස්. (2004), **බොදු මති මතාන්තර.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- විජේසිංහ, එස්.ජී.ජී. සහ සීලක්ඛන්ධ හිමි, වැවගෙදර (2010). **බෞද්ධ දර්ශනයේ පශ්චාත් සංවර්ධනය** (මූලාශ්‍රය විවරණයකි). කොළඹ: සමයවර්ධන පොත්හල (පෞද්.) සමාගම.
- විමලඤාණ හිමි, නාඔටුන්නේ (2014). **තාන්ත්‍රික බුදුසමය,** කඳාන: කර්තෘ ප්‍රකාශනය.
- සාසනරතන හිමි, මොරටුවේ (2012). **ලක්දිව මහායාන අදහස්.** බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශනයෝ.
- සිරි සීවලී හිමි, බඹරැන්දේ (1973). **බෞද්ධ ලෝකය.** කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.
- **සිංහල ශබ්දකෝෂය,** 8 වන කාණ්ඩය හෙවත් 28 වන භාගය. (1983). සංස්කෘතික අමාත්‍යංශය.
- හිරියන්න, ඇම්. (1970). **සඞ්ක්ෂිප්ත ඉන්දීය දර්ශනය.** කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- ලියනගේ, සිරි **බෞද්ධ ශබ්දකෝෂය** 1. කොට්ටාව: කර්තෘ ප්‍රකාශනය.
- **විස්තරාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ගය.** (2008). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.